




# සිත ඇඳුණු චරිත

## ජන හිතවතා



එක්තරා දිනක අතුර ඉරිදා පොළ තුළ මහා කලබගෑනියකි. කවුදෝ දෙදෙනෙක් බැණ ගනිමින් ගහ ගනිති. කිසිවෙකු ඔවුන් බේරීම සඳහා නොයන්නේ කිසිවෙකුට කිට්ටු වීමටවත් බැරි ආකාරයට දෙදෙනාගේ පොරය දරුණු නිසා ය. තවෙකෙක් උල් පිහියක් අමෝරා ගෙන වේගයෙන් එන්නේ එකෙකුට අනින්නට ය. ඔහු පොරකන දෙදෙනා ළඟට කිට්ටුවීමට ඉතා ම ආසන්න ය. එකවිට ම එතැන මතුවූයේ මහා සද්දන්ත දේහයක් ඇති ප්‍රතාපවත් පුද්ගලයෙකි. පැමිණි විගස, පිහිය අමෝරා ගෙන පැමිණි අයගේ පිහිය තිබූ අත එක් අතකින් අල්ලා කරකවා මෙල්ල කොට අනිත් අතින් වැරෙන් පහරක් එල්ල කළේ කම්මුලට ය. කම්මුල් පහර කෑ පුද්ගලයා පිහිය ද එතැන ම අතහැර අත ඇදගෙන දුවගියේ වේගයෙනි. අනිකුත් අය පිළිබඳව ද විපරමින් දෑස් එල්ල කළේ ඔවුන්ටත් හොඳට සැලකීමට විය යුතු ය. එහෙත් පොරකමින් සිටි දෙදෙනා සෙනග අතරින් අන්ත්‍රස්දාන වූයේ ක්ෂණිකව ය. මෙතැනට කඩා වැදී එම ගෝරිය සමථයකට පත්කළ චලෝ මහත්තයා යන ආදරණීය නාමයෙන් පළාතේ සෑම දෙනා විසින් ම හඳුන්වනු ලබන නිර්භීත තේජවන්ත පුද්ගලයාට බිම වැටුණු දිනපොත, කුඩය, ඉවතට විසිවුණු තොප්පිය ආදිය අහුලා දුන්නේ අසල සිටි අය ය.

ලා නිල් පාට ටුවිඩ් රෙද්ද, එම පාට කමිසය, කමිසයට උඩින් අඳින, එම පැහැති ම කෝට් එක එතුමාගේ සුපුරුදු ඇඳුම ය. කකුල් වැහෙන ලෙස සපත්තු කුට්ටමක් පැළඳ සිටී. හිසේ උස රවුම් තොප්පියකි. තොප්පියේ හතරැස් කොටුවක මුළු හතරේ බෝපත් හතරකි. මැද ජාතික කොඩියේ සිංහ ලාංඡනය යි. වැලමිටෙන් නැමුණු අත මැද මිට නැමුණු කුඩය එල්ලෙයි. සාක්කුවේ ද කිසියම් වූ ලාංඡනයක් ඇත. එම ලාංඡනයේ ද සිංහ රූපයක් තිබුණා මෙන් යන්තමට මතක ය. වැඩිපුර ගමන පයින් ය. නිතර ම අතේ ලොකු දින පොතක් සහ මුද්‍රිත කඩදාසි රාශියකි. දේශපාලනය පිළිබඳව ද උනන්දුවෙන් කටයුතු කළ චලෝ මහත්තයාගේ නියම නම වීර පරාක්‍රම ධර්මපාල චන්ද්‍රසිංහ ය. වී. ධ. චන්ද්‍රසිංහ යනුවෙන් ලිඛිත ලේඛනවල සඳහන් වන අවස්ථා ද තිබේ. මෙම නම තම ක්‍රියාවනට ගැලපෙන ලෙස එතුමා විසින් ම සකස් කර ගන්නා ලද නමක් ලෙස අනුමාන කරමි. එතුමාගේ මැතිනිය කුඩා ශරීරයක් ඇති ඉතාමත් කරුණාවන්ත ලෙස හෙමින් කතාකරන කාන්තාවකි. අතුර ඉරිදා පොළ අද මෙන් නොව එවකට චලෝ මහත්තයා සතුව තිබූ භූමියකි. සෑම ඉරිදා ම ඔහු හෝ මැතිනිය සෑම වෙළෙන්දකුගෙන් ම කුලී මුදල් ලබාගෙන පොතක සටහන් කර ගන්නවා අප දැක ඇත. පොළේ ලොකු ම ලොකු කඩයෙන් දෙනු ලබන්නේ රුපියල් දෙකකි. එකයි පනහ, රුපියල, සත පනහ, ආදී වශයෙන් එකතු කරන ස්ථාන ද ඇත. බුලත් පුවක් වැනි ද්‍රව්‍ය පොළට ගෙනැවිත් බිම තබාගෙන විකුණන අයගෙන් සත විසි පහක්, පහළොවක් වැනි මුදලක් ලබා ගන්නවා මම දැක ඇත්තෙමි.

එක්දහස් නවසිය හැටේ මැතිවරණ දෙකේ දී ම ''ජනහිත පක්ෂය'' නම් වූ ඔහු විසින් සාදා ලියාපදිංචි කර ගන්නා ලද පක්ෂයකින් මහා මැතිවරණයට ඉදිරිපත් වූයේ කළගෙඩිය ලකුණෙනි. බොහෝ විට ප්‍රචාරක කටයුතු කළේ තනියම ය. ඊට කලින් ද ලාම්පුව ලකුණින් ඡන්දය ඉල්ලා ඇති බව වැඩිහිටියන් පවසනවා මා අසා ඇත. එම ඡන්ද වකවානුවල ලාම්පුවක් අතින් ගෙන ඡන්ද ප්‍රචාරක කටයුතුවල නියැලුණු බව තතුදත් වැඩිහිටියෝ පවසති. එක්දහස් නවසිය හැට මැතිවරණයේ බුලත්සිංහල ආසනය පුරා තැනින් තැන ප්‍රචාරක දැන්වීම් අලවා තිබුණි. එම පත්‍රිකාවල කළගෙඩිය ලාංඡනය යොදා ඊට ඉදිරියෙන් කතිර ලකුණ ගසා යටින් ''ජන හිත පක්ෂයට ඡන්දය දෙන්න'' යනුවෙන් සටහන්ව තිබූ බවක් යාන්තමට මතකය කියයි. බුලත්සිංහල ආසනය පුරා සෑම නිවසකට ම ගොඩ වී ඡන්ද ප්‍රචාරක දැන්වීම් බෙදීම සිදු කළේ ය. අපේ නිවසට ආ විටක මිදුලේ සිට ඡන්ද දැන්වීම් කොළ කීපයක් අප අතට දී අපේ වත්තේ පාත්තියක වැවී තිබුණු ගොටුකොළ ගස් කීපයක් කඩවා සෝදවාගෙන අමුවෙන් ම කටේ දමා විකා ගිල වතුර වීදුරුවක් ඉල්ලාගෙන බී අනිත් ගෙවල්වලට ගිය ආකාරය මට දැනුදු මැවී පෙනේ. මෙතුමාගේ ප්‍රියතම බීම ඇල්වතුරයි. තේ කඩයකින් වතුර බොනවා නම් තල ගුලියක් කෑමෙන් පසු වතුර එකක් බීම සිරිත ය.

එසේ ම කාව්‍ය රචනයට ද එතුමා ඉතා දක්ෂය. බොහෝ දැන්වීම් පත්‍රිකාවල එතුමා විසින් ම රචනා කරන ලද කවියක් සඳහන්ය.

**මා කිසි ම දැයකට**
**හෝ යම් කිසි කුලයකට**
**යිති නැත සැබවට**
**මගේ අයිතිය මිනිස් වර්ගෙට**

යනුවෙන් බොහෝ ප්‍රචාරක පත්‍රිකාවල මුද්‍රණය කොට තිබිණි. එහි ඉංග්‍රීසි පරිවර්තනය ලෙස I do not belongs to any cast or race. But I am a man kind. යනුවෙන් ද සමහර පත්‍රිකාවල මුද්‍රණය වී තිබිණ. 'ජනහිත ලියුම් කවර' එතුමාගේ තවත් ප්‍රචාරක මාධ්‍යයකි. එතුමාගේ ඡායාරූපය එක් පැත්තකත්, කවරයේ ඉහළ තමාගේ කවියකුත් මුද්‍රණය කර එම ලියුම් කවර සකස් කොට තිබුණි. එවකට අප අතුර මූකලාන යනුවෙන් ව්‍යාවහාර කළ කැලෑ ප්‍රදේශය ''ජනහිත පෙදෙස'' ලෙස නම් කළේ චලෝ මහත්තයා ය.

එතුමාගේ ජනහිත ලියුම් කවරවල පළ කළ කවි සහ වදන් කිහිපයක් මෙසේ ය.

**මේ මහ පොළොව කිසිවෙකු නොම සැදූවෙක**
**මෙය සොබ දහම ලෙස පිහිටිය වස්තුවෙක**
**මෙහි වැසි සැම දෙනට මෙය අයිති වූවෙක**
**හිස් බිම්වල වවමු ආහර වගා වෙක**

**මෙයට, ජන හිතවත් - වී.ධ. සඳසිහ නම් වෙත්**

**මේ මහ පොළොව සහ එහි ඇති සියලු ම වස්තුවත් එහි සියලු ම ජනතාව හෙවත් අප සහ ඔබ සැම සතු ය. ඔබ සැම සතු එම අයිතිය නිරවුල් කර එහි පල ප්‍රයෝජන ඔබ සැමට ලබා දෙන්නා ජනහිත සමගි සමාජය බැවින් ඔබ සැමගේ සම්පූර්ණ අවංක සහයෝගය ජනහිත සමගි සමාජයට දෙන්න. ඔබ සැම ජනහිත ලියුම් කවර මිල දී රැගෙන ඒවා තුළ ඔබ සැමගේ නෑදෑයින්ට හිතවතුන්ට, හිතවතියන්ට ජනහිත දැන්වීම් කොළත් සමග ලියුම් යවන්න.**

**ජනහිත සංවිධායක සහ නායක වී.ධ. චන්ද්‍රසිංහ**

**ජනහිත දැන්වීම් කොළයක් සමග ජනහිත ලියුම් කවරයක් මිල සත 5 පහයි.**

පහත පළවනුයේ ඔහු පුවත්පත් සඟරාදියෙහි පළ කළ දැන්වීමකි.

**ජනහිත පැරකුම් හමුදා යනුවෙන් හැඳින්වෙනුයේ ජනහිත සමගි සමාජයේ ප්‍රචාරක කණ්ඩායම් සමූහය වෙති.**

**රටපුරා සංචාරයේ යෙදී ජනහිත සමගි සමාජයේ පරමාථි සහ අරමුණු ජනතාව අතර ප්‍රචාරය කිරීම සඳහා ශ්‍රම ශක්තිය යෙදවීම හෙවත් වෙහෙසවීමට කැමති 1 සිංහල 2 දෙමළ 3 ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම හෝ ඉන් එකක්වත් ලියන්ට කියවන්ට සහ කථා කරන්ට දැනුමැති වයස අවුරුදු 16 ත් 40ත් අතරැති තරුණ තරුණියන් මෙසේ විමසනු.**

**ජනහිත සංවිධායක සහ නායක**
**වී. ධ. චන්ද්‍රසිංහ**
**ජනහිත මාවත, අතුර, බුලත්සිංහල (ලංකාව)**
**2513 - 1970.4.25**

මෙවන් ලියුම් කවර සහ දැන්වීම් පත්‍රිකා විශාල වශයෙන් මුද්‍රණය කොට බෙදා හැරිය අතර එවකට තිබූ 'දවස' 'රිවිරැස' 'රිවිදින' 'දිනමිණ' ආදී පුවත්පත්වල දැන්වීම් පළ කරමින් තම ප්‍රචාරණ කටයුතු කර ගෙන ගියේ ය.

චලෝ මහත්තයාට සිටියේ එක ම දියණියකි. ඇය කුඩා කල දී ම කිසියම් වූ අසනීපයකින් පසු වී කලුරිය කළා ය. ඇයගේ දේහය භූමදාන කළේ අතුරේ සොහොන් පිටියේ ය. එම ස්ථානය කොටු කොට ඉතා අලංකාර ලෙස මල් වවා නඩත්තු කළ එතුමා තමා ජීවත්ව සිටින තාක් කල් දිනපතා ම සවසට එතැනට ගොස් එහි සාදා තිබූ පහන් පැල තුළ පහනක් පත්තු කළේය. මේ කාර්යය සෑම දිනක ම නොවැරදී ම ඉටු කරන ලද්දකි.

එක්දහස් නවසිය හැත්තෑවේ මහ මැතිවරණයේ දී ඔහු කළ තවත් අපූරු ක්‍රියාවක් වූයේ ඡන්දය දීම වර්ජනය කිරීමයි. දේශපාලන ලෝකයේ කිසියම් වූ භූමිකාවක් වූ ඔහු ඡන්දය දීම ප්‍රතික්ෂේක කිරීමට හේතුව පක්ෂ දේශපාලනය පිළිබඳ එතුමා තුළ පසුව ඇති වූ කලකිරීම විය හැකි ය. ඡන්දය නොදීම සඳහා මිනිසුන් ද උනන්දු කරමින් ප්‍රචාරක පත්‍රිකා ද මුද්‍රණය කොට බෙදා හැර ඇත. ඡන්දය පැවති දින තම නිවසට රැස්ව, ඡන්දය පවත්වන කාලය තුළ තම නිවසින් පිටව නොයන ඡන්ද දායකයන්ට ආහාර, තේ ආදිය සපයමින් සවස මුදලක් ද පිරි නැමූ බව ගම්මු කියති.

කිසියම් වූ වැදගත් සමාජ මෙහෙයකට සමාජයේ යහපතට කටයුතු කළ බුලත්සිංහල ප්‍රදේශයේ නොමැකෙන සටහන් රැසක් තබා අභාවප්‍රාප්ත වූ වීර පරාක්‍රම ධර්මපාල චන්ද්‍රසිංහ හෙවත් චලෝ මහත්තයා නම් වූ එතුමාට නිවන් සැප ප්‍රාර්ථනා කරමු.

**මතු සම්බන්ධයි**